දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல. / My No. PSC/EST09-04/01/2019

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2019.06.18

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

<u>වාර්ෂික ස්ථාන මාරු පටිපාටි සකස්කිරීම</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති අනුව රජයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්ති හා පටිපාටි සකස් කළ යුතු බැවින්, ඔබ අමාත්‍යාංශයේ සහ ඔබ අමාත්‍යාංශයේ විෂය පථයට අදාල සියළු දෙපාර්තමේන්තුවල සේවය කරනු ලබන, මේ දක්වා වාර්ෂික ස්ථානමාරු පටිපාටි සකස් කර නොමැති සේවාවන් වල නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු පටිපාටි සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

02. ඒ අනුව මේ සමඟ ඇති ඇමුණුම 1 හි සඳහන් ආකෘතියට අනුව ඇමුණුම 02 මඟින් ලබා දී ඇති උපදෙස් අනුගමනය කර කෙටුම්පත් කරනු ලැබූ වාර්ෂික ස්ථාන මාරු පටිපාටි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙසත් මේ සම්බන්ධව ඔබ අමාත්‍යාංශය යටතේ ඇති සියළු දෙපාර්තමේන්තු දැනුවත් කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

03. අදාල ආකෘතිය සහ උපදෙස් මාලාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් බාගත කිරීමටද හැකියාව ඇත. (බාගත කිරීම් → ආකෘති පත්‍ර හා පිරික්සුම් ලැයිස්තු → ආයතන → වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්ති සැකසීමේ ආකෘතිය )

එම්.ඒ.බී.දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**ඇමුණුම 01**

**වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්ති සැකසීමේ ආකෘතිය.**

**01.** හැඳින්වීම

- ❖ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009/02/20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව ...................... සඳහා වන ස්ථානමාරු පරිපාටිය යනුවෙන් සඳහන් කළ යුතුය.

**02.** වාර්ෂික ස්ථානමාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර :

**03.** වාර්ෂික ස්ථානමාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

**04.** වාර්ෂික ස්ථානමාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

**05.** වාර්ෂික ස්ථානමාරු ලබා දීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

**06.** වාර්ෂික ස්ථානමාරු කාලසටහන

I. අයදුම්පත්‍ර භාර දිය යුතු අවසාන දිනය

II. වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් අදාල බලධාරියා වෙත ඉදිරිපත් කල යුතු දිනය

III. වාර්ෂික ස්ථාන මාරු යෝජනා ලද පසු ස්ථාන මාරු නියෝග නිකුත් කල යුතු දිනය

IV. වාර්ෂික ස්ථාන මාරු යෝජනා වලට අතෘප්තිමත් නිලධාරීන් සඳහා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 14 වන පරිශිෂ්ඨය අනුව එම ස්ථාන මාරු වලට විරුද්ධව කරුණු දැක්වීම් ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කිරීමට ලබා දී ඇති කාලය

V. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීමේ අවසාන දිනය

VI. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු විසින් අභිනියෝජිත බලධරයා වෙත නිර්දේශ ලබා දිය යුතු අවසාන දිනය.

**VII.** වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කල යුතු දිනය

**VIII.** වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කල යුතු දිනය

**07.** වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි ,

..............................................

අදාල බලධාරියාගේ අත්සන

ඇමුණුම 02

## වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්ති සැකසීම සඳහා උපදෙස්

**01.** හැඳින්වීම

- යම් සේවා ව්‍යවස්ථාවක් හෝ අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ස්ථාන මාරු පටිපාටිය සකස් කරන්නේ නම් ඒ බවද සඳහන් කළ යුතුය.

02. වාර්ෂික ස්ථානමාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර :

i. කුමන ශ්‍රේණිවල නිලධාරීන්ද යන්න.

ii. එක් එක් සේවා ස්ථාන වල සම්පූර්ණ කල යුතු කාල පරිච්ඡේදයන්

උදා: 1. එක් සේවා ස්ථානයක අවු. 06 කට වඩා සේවය කර ඇති නිලධාරීන්.

2. ප්‍රියමනාප සේවා ස්ථානවල අවු.05 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති නිලධාරීන්.

3. අමතර සේවා ස්ථානයක අවු.02 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති නිලධාරීන් ආදී වශයෙන්.

සටහන

ප්‍රියමනාප සේවා ස්ථාන, දුෂ්කර සේවා ස්ථාන වශයෙන් සේවා ස්ථාන වර්ගීකරණයක් කර තිබේනම් ඒ පිළිබඳ විස්තරයක් මගින් ඉදිරිපත් කළ යුතුය. (දීර්ඝ ලැයිස්තුවක් නම්, ඇමුණුමක් මගින් ඉදිරිපත් කරන්න)

iii. ප්‍රමුඛත්වය ලබා දෙන ක්‍රමවේදයක් හා වෙනත් විශේෂිත විස්තර ඇත්නම් ඒවාද සඳහන් කළ යුතුය.

iv. වාර්ෂික ස්ථානමාරු ප්‍රතික්ෂේප වන කරුණු තිබේනම් ඇතුලත් කල යුතුය.

**03.** වාර්ෂික ස්ථානමාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අංක 200 අනුව

**04.** වාර්ෂික ස්ථානමාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අංක 210 අනුව

**05.** වාර්ෂික ස්ථානමාරු ලබා දීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

උදා: 1. වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තියෙන් බැහැර වන කරුණු

2. එකම අමාත්‍යාංශයක් දෙපාර්තමේන්තුවක් අතර සිදු කෙරෙන ස්ථාන මාරු පිළිබඳ විස්තර ආදී වශයෙන්

**06. වාර්ෂික ස්ථානමාරු කාලසටහන**

i. අයදුම්පත්‍ර භාර දිය යුතු අවසාන දිනය ( ජූලි 31 වැනි දින හෝ එදිනට පෙර)

ii. වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් අදාල බලධාරියා වෙත ඉදිරිපත් කල යුතු දිනය (අගෝස්තු 10 වැනි දින හෝ එදිනට පෙර)

iii. වාර්ෂික ස්ථාන මාරු යෝජනා ලද පසු ස්ථාන මාරු නියෝග නිකුත් කල යුතු දිනය (සැප්තැම්බර්15 වැනි දින හෝ එදිනට පෙර)

iv. වාර්ෂික ස්ථාන මාරු යෝජනා වලට අතෘප්තිමත් නිලධාරීන් සඳහා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 14 වන පරිශිෂ්ඨය අනුව එම ස්ථාන මාරු වලට විරුද්ධව කරුණු දැක්වීම් ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කිරීමට ලබා දී ඇති කාලය (නිවාඩු දිනයන්ද ඇතුළුව දින 14 කට වඩා නොවැඩි විය යුතුය)

v. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීමේ අවසාන දිනය (සැප්තැම්බර් 15 වැනි දින හෝ එදිනට පෙර)

vi. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු වෙත භාර දිය යුතු අවසාන දිනය ( ඔක්තොම්බර් 15 වැනි දින හෝ එදිනට පෙර)

vii. වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කල යුතු දිනය (නොවැම්බර් 01 වැනි දින හෝ එදිනට පෙර)

viii. වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කල යුතු දිනය ( ජනවාරි 01 වැනි දින සිට )

**07. වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර**

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XX වන පරිච්ඡේදයේ 231 වන වගන්තිය අනුව ස්ථාන මාරු නියෝගයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනාවක් ඉදිරිපත් කල හැකිය. එම අභියාචනා අංක 23 පරිශිෂ්ඨය ප්‍රකාරව පමණක් ඉදිරිපත් කල යුතු අතර කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 234 වගන්තිය අනුව එම ස්ථාන මාරු නියෝගය නිලධාරියා වෙත ලද දින සිට දින 14 ක් ඇතුලත ඉදිරිපත් කල යුතු බවද මෙම විස්තර යටතේ සඳහන් කල යුතුය .